62473



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

| | | |
|---|---|---|
| ආර්ථික විද්‍යාව I<br>பொருளியல் I<br>Economics I | 21 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
※ උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** අභිමතානුරූපී ආර්ථික විද්‍යාව සහ යථානුරූපී ආර්ථික විද්‍යාව අතර පවත්නා මූලික වෙනස වනුයේ

(1) අභිමතානුරූපී ආර්ථික විද්‍යාව විස්තරාත්මක විශ්ලේෂණයක් ලබා දීමත් යථානුරූපී ආර්ථික විද්‍යාව ප්‍රතිපත්තිමය නිර්දේශ ලබා දීමත් ය.
(2) යථානුරූපී ආර්ථික විද්‍යාව කරුණු මත පදනම් වීමත් අභිමතානුරූපී ආර්ථික විද්‍යාව සාරධර්ම මත පදනම් වීමත් ය.
(3) අභිමතානුරූපී ආර්ථික විද්‍යාව ප්‍රත්‍යක්ෂමූල සාක්ෂි මත පදනම් වීමත් යථානුරූපී ආර්ථික විද්‍යාව ආත්මීය අදහස් මත පදනම් වීමත් ය.
(4) යථානුරූපී ආර්ථික විද්‍යාව අගය-විනිශ්චය මත විශ්වාසය තැබීමත් අභිමතානුරූපී ආර්ථික විද්‍යාව විෂය මූල වීමත් ය.
(5) යථානුරූපී ආර්ථික විද්‍යාව ආචාර ධර්ම කෙරෙහි අවධානය යොමු කිරීමත් අභිමතානුරූපී ආර්ථික විද්‍යාව පරීක්ෂාවට ලක් කළ හැකි කල්පිත කෙරෙහි අවධානය යොමු කිරීමත් ය.

**2.** ආර්ථික විද්‍යාවේ 'ප්‍රාග්ධනය' සංකල්පය වඩාත් මැනවින් පැහැදිලි කරනුයේ පහත සඳහන් කවර ප්‍රකාශය ද?

(1) ප්‍රාග්ධනය නිෂ්පාදන ක්‍රියාවලිය තුළ යොදා ගැනෙන මානව ශ්‍රමය සහ නව්‍යතා නියෝජනය කරයි.
(2) පුද්ගලයන් විසින් කරනු ලබන ඕනෑම මූල්‍ය ආයෝජනයක් ප්‍රාග්ධනය ලෙස හැඳින්වේ.
(3) ප්‍රාග්ධනයට ඇතුළත් වනුයේ නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන යන්ත්‍ර සූත්‍ර සහ ගොඩනැගිලි වැනි ස්පෘශ්‍ය වත්කම් පමණක් ය.
(4) ප්‍රාග්ධනය යනු නිෂ්පාදනයට අරමුදල් සපයා ගැනීම සඳහා යොදා ගැනෙන මූල්‍ය සම්පත් ය.
(5) ප්‍රාග්ධනය යනු නිෂ්පාදනය කරන ලද නිෂ්පාදන මාධ්‍යයන් ය.

**3.** නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය දිගේ එක් ලක්ෂ්‍යයක සිට තවත් ලක්ෂ්‍යයකට ගමන් කිරීමේ දී

(1) ආවස්ථික පිරිවැයෙහි හෝ නිෂ්පාදන කාර්යක්ෂමතාවේ හෝ වෙනසක් සිදු නොවේ.
(2) ආවස්ථික පිරිවැයෙහි වෙනසක් සිදුවන නමුදු නිෂ්පාදන කාර්යක්ෂමතාවේ වෙනසක් සිදු නොවේ.
(3) නිෂ්පාදන කාර්යක්ෂමතාවේ වෙනසක් සිදුවන නමුදු ආවස්ථික පිරිවැයෙහි වෙනසක් සිදු නොවේ.
(4) ආවස්ථික පිරිවැයෙහි හෝ සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාවේ හෝ වෙනසක් සිදු නොවේ.
(5) නිෂ්පාදන කාර්යක්ෂමතාවේ වෙනසක් සිදුවන නමුදු සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාවේ වෙනසක් සිදු නොවේ.

**4.** සමාජවාදී ආර්ථික පද්ධතියක ප්‍රධාන ලක්ෂණයක් වනුයේ

(1) මුඛ්‍ය අරමුණ ලෙස ලාභය උපරිම කිරීමයි.
(2) සියලු නිෂ්පාදන මාධ්‍යවල පෞද්ගලික හිමිකාරිත්වයයි.
(3) ප්‍රධාන කර්මාන්ත සහ සම්පත්වල පොදු අයිතියයි.
(4) ආර්ථිකයට රජයේ මැදිහත්වීම අවම වීමයි.
(5) ආර්ථික තීරණ සම්බන්ධයෙන් රජය කිසිදු කාර්යභාරයක් ඉටු නොකිරීමයි.

**5.** සැපයුම් වක්‍රය දිගේ චලනයක් ඇති කළ හැකි සාධකය වනුයේ

(1) නිෂ්පාදන පිරිවැයෙහි වෙනස්වීමකි.
(2) අදාළ භාණ්ඩයේ ම මිලෙහි වෙනස්වීමකි.
(3) පාරිභෝගික ආදායමෙහි වෙනස්වීමකි.
(4) තාක්ෂණයෙහි වෙනස්වීමකි.
(5) සැපයුම්කරුවන් සංඛ්‍යාවෙහි වෙනස්වීමකි.

**6.** එක් කරුණක් හැර පහත සඳහන් සියල්ල ම සාමාන්‍ය භාණ්ඩයක් සඳහා ඇති වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වීමට හේතු වේ. එසේ **නොවන** කරුණ වනුයේ
(1) ආදේශක භාණ්ඩයක මිල ඉහළ යෑම ය.
(2) පාරිභෝගිකයන්ගේ ආදායම ඉහළ යෑම ය.
(3) අනුපූරක භාණ්ඩයක මිල පහළ බැසීම ය.
(4) අදාළ භාණ්ඩයෙහි මිල පහළ බැසීම ය.
(5) වෙළෙඳපොළ තුළ පාරිභෝගිකයන්ගේ සංඛ්‍යාව ඉහළ යෑම ය.

**7.** අනෙකුත් කරුණු නොවෙනස් ව තිබිය දී බාල භාණ්ඩයක මිල පහළ බසින විට
(1) ආදායම් ප්‍රතිවිපාකය ආදේශන ප්‍රතිවිපාකය අභිබවා යන බැවින් පාරිභෝගිකයන් එම භාණ්ඩය වැඩිපුර ඉල්ලා සිටිනු ඇත.
(2) බාල භාණ්ඩයක් වන බැවින් පාරිභෝගිකයන් එම භාණ්ඩය අඩුවෙන් ඉල්ලුම් කරනු ඇත.
(3) ආදේශන ප්‍රතිවිපාකය සහ ආදායම් ප්‍රතිවිපාකය එකිනෙකා ශක්තිමත් කරන බැවින් පාරිභෝගිකයන් එම භාණ්ඩය වැඩිපුර ඉල්ලා සිටිනු ඇත.
(4) ආදේශන ප්‍රතිවිපාකය සෘණ වන බැවින් පාරිභෝගිකයන් එම භාණ්ඩය අඩුවෙන් ඉල්ලුම් කරනු ඇත.
(5) ආදේශන ප්‍රතිවිපාකය ආදායම් ප්‍රතිවිපාකය අභිබවා යන බැවින් පාරිභෝගිකයන් එම භාණ්ඩය වැඩිපුර ඉල්ලා සිටිනු ඇත.

**8.** X භාණ්ඩය සහ Y භාණ්ඩය ආදේශක භාණ්ඩ වේ යැයි සලකන්න. Y භාණ්ඩයේ සැපයුම වැඩිවීමක් නිසා X භාණ්ඩයේ සමතුලිත මිල හා ප්‍රමාණය මත ඇතිවන බලපෑම කවරක් ද?

| | X භාණ්ඩයේ සමතුලිත මිල | X භාණ්ඩයේ සමතුලිත ප්‍රමාණය |
|---|---|---|
| (1) | වැඩි වේ | අඩු වේ |
| (2) | අඩු වේ | අඩු වේ |
| (3) | වැඩි වේ | වැඩි වේ |
| (4) | අඩු වේ | වැඩි වේ |
| (5) | වැඩි වේ | වෙනස් නොවේ |

**9.** තරගකාරී වෙළෙඳපොළක අලෙවි වන X භාණ්ඩය නිෂ්පාදනයේ දී නව තාක්ෂණයක් හඳුන්වා දී ඇතැයි සලකන්න. නව තාක්ෂණය X භාණ්ඩයෙහි නිෂ්පාදන පිරිවැය අඩු කරන්නේ නම් පාරිභෝගික සහ නිෂ්පාදක අතිරික්ත කෙරෙහි ඇතිවිය හැකි බලපෑම කුමක් ද?
(1) නිෂ්පාදක අතිරික්තය වැඩිවන නමුත් පාරිභෝගික අතිරික්තය අඩුවනු ඇත.
(2) පාරිභෝගික අතිරික්තය වැඩිවන නමුත් නිෂ්පාදක අතිරික්තය අඩුවනු ඇත.
(3) පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදක අතිරික්තය යන දෙක ම වැඩිවනු ඇත.
(4) පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදක අතිරික්තය යන දෙක ම අඩුවනු ඇත.
(5) පාරිභෝගික අතිරික්තය වැඩිවන අතර නිෂ්පාදක අතිරික්තයට බලපෑමක් ඇති නොවේ.


**10.** භාණ්ඩයක් සඳහා ඇති ඉල්ලුමේ මිල නම්‍යතාව සාමාන්‍යයෙන් ඉහළ අගයක් ගනු ලබන්නේ එම භාණ්ඩය
(1) පාරිභෝගික වියදමෙහි කුඩා කොටසක් සහ අනෙකුත් භාණ්ඩ සඳහා අනුපූරක භාණ්ඩයක් වන විට දී ය.
(2) අත්‍යවශ්‍ය සහ නශ්‍ය භාණ්ඩයක් වන විට දී ය.
(3) පාරිභෝගික වියදමෙහි කුඩා කොටසක් සහ අනෙකුත් භාණ්ඩ සඳහා ආදේශක භාණ්ඩයක් වන විට දී ය.
(4) පාරිභෝගික වියදමෙහි විශාල කොටසක් සහ අනෙකුත් භාණ්ඩ සඳහා ආදේශක භාණ්ඩයක් වන විට දී ය.
(5) බාල භාණ්ඩයක් සහ අනෙකුත් භාණ්ඩ සඳහා අනුපූරක භාණ්ඩයක් වන විට දී ය.

**11.** ඉල්ලුමේ හරස් මිල නම්‍යතාව
(1) කිසියම් භාණ්ඩයක් අත්‍යවශ්‍ය භාණ්ඩයක් ද නැතහොත් බාල භාණ්ඩයක් ද යන්න දැක්වීමට සමත් වේ.
(2) සලකා බලන භාණ්ඩ දෙක සමීප ව සම්බන්ධ වී ඇත්නම් ශුන්‍යයට ආසන්න වේ.
(3) සලකා බලන භාණ්ඩ දෙක ආදේශක භාණ්ඩ වේ නම් ශුන්‍යයට වඩා ඉහළ අගයක් ගනී.
(4) ඉල්ලුම් නීතිය නිසා සැමවිට ම සෘණ අගයක් ගනී.
(5) සලකා බලන භාණ්ඩ දෙක අනුපූරක භාණ්ඩ වේ නම් ශුන්‍යයට වඩා ඉහළ අගයක් ගනී.

[කුන්වැනි පිටුව බලන්න

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න


**12.** ඉතා දැඩි ලෙස නියාමනයට ලක්ව පැවැති ආර්ථිකයක් වෙළෙඳපොළ ආර්ථිකයක් කරා ගමන් කිරීමට තීරණය කර, වෙළෙඳපොළ රජයේ මිල පාලනයන් ඉවත් කර දැමුවේ යැයි සලකන්න. රූපසටහනෙහි දැක්වෙන්නේ ආරම්භයේ දී රජය උපරිම සඵල මිලක් නියම කර තිබූ එවැනි වෙළෙඳපොළකි.




රජය උපරිම මිල ඉවත් කළ විට මිල සහ ප්‍රමාණය කෙරෙහි ඇති වූ බලපෑම කුමක් ද?

| | මිල | ප්‍රමාණය |
|---|---|---|
| (1) | රු. 60 සිට රු. 40ට පහළ බසී | හිඟය ඉවත් වේ |
| (2) | රු. 50 සිට රු. 40ට පහළ බසී | අතිරික්තය ඉවත් වේ |
| (3) | රු. 40 සිට රු. 50ට ඉහළ නගී | හිඟය ඉවත් වේ |
| (4) | රු. 50 සිට රු. 40ට පහළ බසී | හිඟය ඉවත් වේ |
| (5) | රු. 50 සිට රු. 60ට ඉහළ නගී | අතිරික්තය ඉවත් වේ |

**13.** රූපසටහනෙහි $D_1$ සීනි සඳහා ඉල්ලුම් වක්‍රය වන අතර $S_1$ ආරම්භක සැපයුම් වක්‍රය වේ. රජය සීනි සඳහා විශේෂිත බද්දක් පැනවීම නිසා සැපයුම් වක්‍රය $S_2$ දක්වා විතැන් වේ යැයි සලකන්න.




එහි ප්‍රතිඵල වශයෙන් රජයට ලැබෙන බදු අයභාරය, නව නිෂ්පාදක අතිරික්තය සහ අහිමි වූ සුබසාධනය (deadweight loss) මැනෙනුයේ රූපසටහනෙහි කවර ප්‍රදේශවලින් ද?

| | බදු අයභාරය | නව නිෂ්පාදක අතිරික්තය | අහිමි වූ සුබසාධනය |
|---|---|---|---|
| (1) | B + C + G | H | A + H |
| (2) | E + F | F + G + H | E + F |
| (3) | B + C | C + G + H | E + F + M |
| (4) | B + C + G | H | E + F |
| (5) | B + C + G | F + G + H | E + F + M |

**14.** රජයක් පාරිභෝගිකයන්ට සහල් මිල වැඩි නොකොට වී ගොවීන්ගේ ආදායම් වැඩි කිරීමට අදහස් කරනවා යැයි සිතමු. රජයේ අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා වඩාත් යෝග්‍ය ප්‍රතිපත්තිය වනුයේ

(1) රජයේ සහල් තොග වෙළෙඳපොළට මුදාහැරීම ය.
(2) විකුණාගත නොහැකි වූ නිමැවුම රජය විසින් මිල දී ගැනීමේ එකඟතාවක් සහිත ව වෙළෙඳපොළ මිලට වඩා ඉහළ සහතික මිලක් සහල් සඳහා නියම කිරීම ය.
(3) විකුණාගත නොහැකි වූ නිමැවුම රජය විසින් මිල දී ගැනීමේ එකඟතාවක් සහිත ව වෙළෙඳපොළ මිලට වඩා පහළ අවම මිලක් සහල් සඳහා හඳුන්වා දීම ය.
(4) වෙළෙඳපොළ මිලට වඩා පහළ උපරිම මිලක් සහල් සඳහා හඳුන්වා දීම ය.
(5) වී ගොවීන් සඳහා සහනාධාරයක් ගෙවීම ය.

**15.** කර්මාන්ත ලක්ෂණ පිළිබඳ පහත දැක්වෙන කවර සංයෝජනයක් ඒකාධිකාරී තරග කර්මාන්තය පෙන්නුම් කරන්නේ ද?

| | ප්‍රවේශවීමේ නිදහස | නිෂ්පාදිතයේ ස්වරූපය | ආයතනයේ ඉල්ලුම් වක්‍රය |
|---|---|---|---|
| (1) | දැඩි බාධක පවතී | සමජාතීය වේ | පහළට බෑවුම් වේ |
| (2) | දැඩි බාධක පවතී | ප්‍රභේදනය වේ | පහළට බෑවුම් වේ |
| (3) | බාධක අඩු ය | සමජාතීය වේ | තිරස් රේඛාවකි |
| (4) | බාධක අඩු ය | ප්‍රභේදනය වේ | පහළට බෑවුම් වේ |
| (5) | දැඩි බාධක පවතී | සුවිශේෂී වේ | තිරස් රේඛාවකි |

**16.** කෙටි කාලයේ දී පූර්ණ තරගකාරී ආයතනයක ආර්ථික ලාභ ශූන්‍ය වනුයේ

(1) මිල ආන්තික පිරිවැයට සමාන වන විට ය.
(2) මුළු අයභාරය මුළු විචල්‍ය පිරිවැයට සමාන වන විට ය.
(3) ආන්තික පිරිවැය සාමාන්‍ය විචල්‍ය පිරිවැයට සමාන වන විට ය.
(4) ආන්තික අයභාරය සාමාන්‍ය ස්ථාවර පිරිවැයට සමාන වන විට ය.
(5) මිල සාමාන්‍ය මුළු පිරිවැයට සමාන වන විට ය.

**17.** පරිමාණානුකූල නොපිරිමැසුම්වලට මුහුණදෙමින් සිටින ආයතනයක් අත්විඳිනුයේ
(1) කෙටි කාලයේ දී ආන්තික පිරිවැය ඉහළ යාමකි.
(2) නිමැවුම වැඩිවන විට දිගු කාලීන සාමාන්‍ය මුළු පිරිවැය ඉහළ යාමකි.
(3) දිගු කාලීන සාමාන්‍ය මුළු පිරිවැය අඩුවීමකි.
(4) යෙදවුම් වැඩි කරනවාට වඩා විශාල ප්‍රමාණයකින් නිමැවුමේ ඉහළ යාමකි.
(5) නිමැවුම් මට්ටම කවරක් වුව ද දිගුකාලීන සාමාන්‍ය මුළු පිරිවැය ස්ථාවර ව පැවැතීම ය.

**18.** පහත දැක්වෙන වගුව නිෂ්පාදන ආයතනයක විවිධ නිමැවුම් මට්ටම් සඳහා අදාළ මුළු පිරිවැය සහ ආන්තික පිරිවැය පෙන්නුම් කරයි.

| නිමැවුම් මට්ටම | මුළු පිරිවැය (රු.) | ආන්තික පිරිවැය (රු.) |
|---|---|---|
| 1 | 250 | 50 |
| 2 | 295 | 45 |
| 3 | 330 | 35 |
| 4 | 375 | 45 |
| 5 | 425 | 50 |

නිමැවුම් ඒකක 5ක් නිෂ්පාදනය කිරීමේ දී සාමාන්‍ය ස්ථාවර පිරිවැය කොපමණ ද?
(1) රු. 300 (2) රු. 200 (3) රු. 150 (4) රු. 60 (5) රු. 40

**19.** එකතු කළ අගය ක්‍රමවේදයට අනුව දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරනු ලබන්නේ
(1) අතරමැදි භාණ්ඩවල අගය නිමැවුමේ වටිනාකමෙන් අඩු කිරීමෙනි.
(2) නිෂ්පාදනය කරන ලද සියලු ම අවසාන භාණ්ඩ හා සේවාවල වටිනාකම එකතු කිරීමෙනි.
(3) ආර්ථිකයක ජනනය වන මුළු ආදායම් එකතු කිරීමෙනි.
(4) නිෂ්පාදනයේ දී භාවිත කරන ලද සියලු ම අතරමැදි භාණ්ඩවල අගය එකතු කිරීමෙනි.
(5) නිමැවුමේ මුළු වටිනාකමින් ආනයනවල වටිනාකම අඩු කිරීමෙනි.

**20.** නොවිධිමත් ආර්ථිකය (informal economy) ලෙස සැලකෙන්නේ
(1) නීති විරෝධී සහ රජයෙන් වසන් කරනු ලබන ක්‍රියාකාරකම් ය.
(2) රජය විසින් අධීක්ෂණය හෝ නියාමනය හෝ නොකරනු ලබන ආර්ථික ක්‍රියාකාරකම් ය.
(3) කුඩා ව්‍යාපාර විසින් සිදුකරනු ලබන සියලු ම ආර්ථික ක්‍රියාකාරකම් ය.
(4) විශාල සමාගම් සහ ලාභ අරමුණු කොට නොගත් ආයතන අතර සිදුවන ආර්ථික ගනුදෙනු ය.
(5) ආර්ථිකයේ යැපුම් කෘෂිකාර්මික අංශය ය.

**21.** දළ ජාතික ආදායමට වඩා දළ ජාතික වැය කළ හැකි ආදායම ඉහළින් පවත්නා ආර්ථිකයක් පිළිබිඹු කරන්නේ
(1) රට වෙළෙඳ හිඟයක් අත්විඳිමින් සිටින බවයි.
(2) රට වෙළෙඳ අතිරික්තයක් අත්විඳිමින් සිටින බවයි.
(3) රටේ දේශීය නිෂ්පාදනය එහි පරිභෝජනය ඉක්මවා යන බවයි.
(4) රට ආයෝජනය කරනවාට වඩා ඉතිරි කරන බවයි.
(5) රටෙහි විදේශ ශුද්ධ සංක්‍රාම ධන අගයක් ගන්නා බවයි.

**22.** කල්පිත ආර්ථිකයක් සඳහා තෝරා ගත් ජාතික ආදායම් ගිණුම් දත්ත කිහිපයක් පහත වගුවේ දැක්වේ. (සංඛ්‍යා රුපියල් බිලියනවලිනි.)

| අයිතමය | වටිනාකම | අයිතමය | වටිනාකම |
|---|---|---|---|
| සේවක ආදායම් | 600 | නිෂ්පාදනය මත වෙනත් බදු (අඩු කළා එම සහනාධාර) | 50 |
| දළ මෙහෙයුම් අතිරික්තය | 800 | අවශේෂ ලෝකයෙන් ලද ශුද්ධ ප්‍රාථමික ආදායම | −20 |
| දළ මිශ්‍ර ආදායම | 850 | භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු අඩු කළා එම සහනාධාර | 120 |
| ස්ථාවර ප්‍රාග්ධනය පරිභෝජනය | 150 | | |

දළ දේශීය නිෂ්පාදිතයේ සහ දළ ජාතික ආදායමේ වටිනාකම් කවරේ ද?

| | දළ දේශීය නිෂ්පාදිතය | දළ ජාතික ආදායම |
|---|---|---|
| (1) | 2 420 | 2 400 |
| (2) | 2 270 | 2 250 |
| (3) | 2 420 | 2 440 |
| (4) | 2 570 | 2 550 |
| (5) | 2 250 | 2 230 |

**23.** රජයේ කටයුතු නොමැති සංවෘත ආර්ථිකයක රු. මිලියන 200කින් ආයෝජනය වැඩිවීමේ ප්‍රතිඵල වශයෙන් පරිභෝජනය රු. මිලියන 800කින් වැඩි වේ. මෙම ආර්ථිකය තුළ ආන්තික පරිභෝජන නැඹියාව කොපමණ ද?
(1) 0.2 (2) 0.25 (3) 0.75 (4) 0.8 (5) 0.9


[පස්වැනි පිටුව බලන්න

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



**24.** මෙම රූපසටහන පෙන්නුම් කරන්නේ සමාහාර ඉල්ලුම් වක්‍රයකි. එහි තිරස් අක්ෂය මත මැනෙනුයේ කවරක් ද?




(1) නාමික ජාතික ආදායම
(2) නාමික ජාතික නිමැවුම
(3) නාමික වැය කළ හැකි ආදායම
(4) මූර්ත දළ දේශීය නිෂ්පාදිතය
(5) විභව නිමැවුම් මට්ටම

**25.** සමාහාර ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර ඡේදනය වන ස්ථානයෙහි ආර්ථිකය සමතුලිතතාවේ පවතී යැයි උපකල්පනය කරන්න. අනුරූපී බදු වැඩි කිරීමක් නොමැති ව රජයේ වියදම් වැඩි වීමක් සිදුවන්නේ නම් බොහෝ සෙයින් වියහැකි කෙටි කාලීන බලපෑම කවරක් ද?

(1) සේවා වියුක්තිය ඉහළ නංවමින් සමාහාර ඉල්ලුම් වක්‍රය වමට විතැන් වේ.
(2) ඉහළ නිමැවුම් මට්ටමක් සහ ඉහළ සේවා නියුක්තියක් ඇති කරමින් සමාහාර ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වේ.
(3) සමාහාර ඉල්ලුම් වක්‍රය වෙනස් නොවන නමුදු සමාහාර සැපයුම් වක්‍රය වමට විතැන් වේ.
(4) අඩු නිමැවුමක් සහ අඩු සේවා නියුක්ති මට්ටමක් කරා යොමු කරමින් සමාහාර ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වේ.
(5) පහළ මිල මට්ටමක් ඇති කරමින් සමාහාර ඉල්ලුම් වක්‍රය වමට විතැන් වේ.

**26.** ව්‍යාපාරිකයෙක් තම සේප්පුවෙන් රු. 50 000ක් ඉවතට ගෙන එම මුදල වාණිජ බැංකුවක තැන්පත් කළේ යැයි සිතන්න. බැංකුව සතුව අධි සංචිත නොමැති නම් සහ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව 10%ක් වේ නම් මෙම තැන්පතුව නිසා බැංකුවේ අවශ්‍ය සංචිත ප්‍රමාණය සහ බැංකුවේ ණයදීමේ හැකියාව වැඩි වන්නේ කෙසේ ද?

| | අවශ්‍ය සංචිත (රු.) | ණයදීමේ හැකියාව (රු.) |
|---|---|---|
| (1) | 50 000 | 40 000 |
| (2) | 50 000 | 50 000 |
| (3) | 40 000 | 5 000 |
| (4) | 5 000 | 45 000 |
| (5) | 5 000 | 500 000 |

**27.** ඉල්ලුමෙන් ඇදුණු සහ පිරිවැයෙන් තල්ලුවුණු උද්ධමන අතර වෙනස වඩාත් හොඳින් පෙන්වා දෙන්නේ පහත දැක්වෙන කවර ප්‍රකාශය මගින් ද?

(1) ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය අධි සැපයුම් තත්ත්වයක් නිසා හට ගන්නා අතර, පිරිවැයෙන් තල්ලුවුණු උද්ධමනය අධි ඉල්ලුම් තත්ත්වයක් නිසා හට ගනී.
(2) ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය සමාහාර සැපයුමෙහි වැඩිවීමක් නිසා හට ගන්නා අතර, සමාහාර ඉල්ලුමේ අඩුවීමක් නිසා පිරිවැයෙන් තල්ලුවුණු උද්ධමනය හට ගනී.
(3) ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය වැටුප් අනුපාතික ඉහළ යාම නිසා හට ගන්නා අතර, මුදල් සැපයුමේ අධි ප්‍රසාරණයක් නිසා පිරිවැයෙන් තල්ලුවුණු උද්ධමනය හට ගනී.
(4) ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය සමාහාර ඉල්ලුමේ වැඩිවීම මගින් මෙහෙයවනු ලබන අතර, පිරිවැයෙන් තල්ලුවුණු උද්ධමනය නිෂ්පාදන පිරිවැය වැඩිවීම මගින් මෙහෙයවනු ලබයි.
(5) ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය ඉහළ සේවා නියුක්තියක් ඇති කරන අතර, පිරිවැයෙන් තල්ලුවුණු උද්ධමනය අඩු සේවා නියුක්තියක් ඇති කරයි.

**28.** අධි බලැති මුදල්වලට ඇතුළත් වන්නේ

(1) වාණිජ බැංකුවල ඇති මහජනයා සතු කාලීන තැන්පතු ය.
(2) බලපත්‍රලාභී බැංකුවල සහ මූල්‍ය සමාගම්වල ඇති මහජනයා සතු ඉතුරුම් තැන්පතු ය.
(3) මහජනයා සතු ව්‍යවහාර මුදල් සහ වාණිජ බැංකු සංචිත ය.
(4) වාණිජ බැංකු විසින් නිකුත් කරන ලද ණය ය.
(5) මහ බැංකුව සතු විදේශ වත්කම් ය.

**29.** පොලී අනුපාතික සහ මුදලට ඇති සමපේක්ෂණ ඉල්ලුම අතර ඇති සම්බන්ධය වඩාත් හොඳින් පැහැදිලි කරන ප්‍රකාශය තෝරන්න.

(1) මුදල් සඳහා ඇති සමපේක්ෂණ ඉල්ලුම පොලී අනුපාතිකවලින් ස්වාධීන වේ.
(2) මුදල් සඳහා ඇති සමපේක්ෂණ ඉල්ලුම පොලී අනුපාතිකවලට සෘජුව ම සමානුපාතික වේ.
(3) මුදල් සඳහා ඇති සමපේක්ෂණ ඉල්ලුම පොලී අනුපාතික ඉහළ යන විට වැඩි වේ.
(4) මුදල් සඳහා ඇති සමපේක්ෂණ ඉල්ලුම පොලී අනුපාතික ඉහළ යනවිට අඩු වේ.
(5) මුදල් සඳහා ඇති සමපේක්ෂණ ඉල්ලුම ඉහළ පොලී අනුපාතික යටතේ අපරිමිත වේ.

**30.** 2023 නව මහ බැංකු පනත මගින් ශ්‍රී ලංකා මහ බැංකුව වළක්වාලනු ලැබ ඇත්තේ
(1) මුදල් අච්චු ගැසීමෙනි.
(2) ආණ්ඩුවට සෘජු ව හෝ වක්‍ර ව හෝ ණය ලබා දීමෙනි.
(3) ආණ්ඩුවේ බැංකුකරුවා ලෙස ඉටු කරනු ලබන කාර්යය කිරීමෙනි.
(4) මූල්‍ය ප්‍රතිපත්ති උපකරණයක් ලෙස විවට වෙළෙඳපොළ කටයුතු කිරීමෙනි.
(5) විදේශ විනිමය වෙළෙඳපොළට මැදිහත් වීමෙනි.

**31.** පොදු භාණ්ඩ සන්දර්භය තුළ 'තරගකාරී නොවන පරිභෝජනය' යන්නෙන් අදහස් වන්නේ
(1) අන් අයට ලබා ගත හැකි ප්‍රමාණය අඩු නොකොට එක් පුද්ගලයකුට කිසියම් භාණ්ඩයක් පරිභෝජනය කළ හැකි බව ය.
(2) එම භාණ්ඩය සඳහා ගෙවීමක් නොකරන පුද්ගලයන්ට එම භාණ්ඩය ලබා දිය නොහැකි බව ය.
(3) මුදල් නොගෙවන ජනතාව පරිභෝජනයෙන් බැහැර කළ නොහැකි බව ය.
(4) එක් පුද්ගලයකු විසින් පොදු භාණ්ඩයක් පරිභෝජනය කිරීම අන් අයට එම භාණ්ඩය ලබා ගැනීමට ඇති හැකියාව අඩු කරන බව ය.
(5) පොදු භාණ්ඩ පරිභෝජනය කළ හැක්කේ ඒවාට ගෙවීමක් කළ අයට පමණක් බව ය.

**32.** ප්‍රතික්‍රමික බද්දක ප්‍රධාන ලක්ෂණයක් වශයෙන් සඳහන් කළ හැකි වනුයේ
(1) ඉහළ ආදායම් උපයන්නන්ට වඩා අඩු ආදායම් උපයන්නන් තම ආදායමෙන් වැඩි ප්‍රතිශතයක් බදු වශයෙන් ගෙවන බව ය.
(2) ආන්තික බදු අනුපාතික සාමාන්‍ය බදු අනුපාතික ඉක්මවා යන බව ය.
(3) බද්ද එකතු කිරීමේ පිරිවැය එමගින් එකතු කරගත් අයභාරය ඉක්මවා යන බව ය.
(4) අඩු ආදායම් උපයන්නන්ට වඩා ඉහළ ආදායම් උපයන්නන් සඳහා ආන්තික බදු අනුපාතිකය වැඩි බව ය.
(5) ආදායම වැඩි වන විට බදු අනුපාතික ද වැඩි වන බව ය.

**33.** සංක්‍රාම ගෙවීම් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියට කරනු ලබන බලපෑම පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) ආණ්ඩුවේ වියදම ඉහළ යාම මගින් සංක්‍රාම ගෙවීම් සමාහාර ඉල්ලුමට සෘජුව ම බලපායි.
(2) ආණ්ඩුවේ වියදමේ කොටසක් නොවන බැවින් සංක්‍රාම ගෙවීම් අයවැය හිඟයට බලනොපායි.
(3) භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනයට සෘජු දායකත්වයකින් තොරව සංක්‍රාම ගෙවීම් ආණ්ඩුවේ වියදම් වැඩි කරයි.
(4) ආයෝජනය උත්තේජනය කිරීමෙන් සංක්‍රාම ගෙවීම් ආර්ථික වර්ධනය දිරිමත් කරයි.
(5) කුටුම්බවල වැය කළ හැකි ආදායම අඩු කිරීම මගින් සංක්‍රාම ගෙවීම්වලට සමාහාර ඉල්ලුම කෙරෙහි බලපෑමක් කළ හැකි වේ.

**34.** 2022 වර්ෂයෙන් පසු ව ශ්‍රී ලංකාවේ බදු ආදායම සැලකිය යුතු ලෙස ඉහළ යාමට ප්‍රධාන දායකත්වය සැපයුවේ
(1) ආදායම් බදු, ආනයන බදු සහ ආර්ථික සේවා ගාස්තු ය.
(2) විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද, ආදායම් බදු සහ එකතු කළ අගය මත බද්ද ය.
(3) ආදායම් බදු, එකතු කළ අගය මත බදු සහ නිෂ්පාදන බදු ය.
(4) විදේශ වෙළෙඳාම මත බදු, එකතු කළ අගය මත බද්ද සහ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ය.
(5) වරාය සහ ගුවන්තොටුපොළ සංවර්ධන බද්ද, ජාතිය ගොඩ නැගීමේ බද්ද සහ එකතු කළ අගය මත බද්ද ය.

**35.** ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ සන්දර්භය තුළ 'ණය තිරසාර විශ්ලේෂණය' (Debt Sustainability Analysis - DSA) යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?
(1) ණය පැහැර හැරීමකින් තොර ව රටකට දැරිය හැකි ණය ප්‍රමාණය තීරණය කිරීම සඳහා විශ්ලේෂණයකි.
(2) රටක දැනට පවත්නා විදේශ ණය වගකීම් සපුරාලීමට ඇති හැකියාව පිළිබඳ තක්සේරුවකි.
(3) පවතින ණය මත පොලී ගෙවීම් අඩු කිරීම සඳහා යොදා ගැනෙන ක්‍රමවේදයකි.
(4) රටකට ණය ගෙවීමට ඇති දිගු කාලීන හැකියාව පිළිබඳ විශ්ලේෂණයකි.
(5) වසර පහක් ඇතුළත සියලු ම හිඟ ණය ආපසු ගෙවීම පිළිබඳ විශ්ලේෂණයකි.

**36.** රටකට භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ දී සාපේක්ෂ වාසියක් හිමි වනුයේ
(1) එම භාණ්ඩය නිෂ්පාදනය කිරීම සඳහා එරටට අඩු ම ආවස්ථික පිරිවැයක් ඇත්නම් ය.
(2) එම රටට වෙනත් ඕනෑම රටකට වඩා එම භාණ්ඩයෙන් වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කළ හැකි නම් ය.
(3) එම භාණ්ඩය ඉහළ මිලකට අලෙවි කළ හැකි වේ නම් ය.
(4) එම භාණ්ඩය ඉහළ ම ලාභ ආන්තිකයක් සහිත ව එම රට නිෂ්පාදනය කරන්නේ නම් ය.
(5) එරටට වෙනත් රටකට වඩා අඩු සම්පත් ප්‍රමාණයක් භාවිත කරමින් භාණ්ඩයක් නිෂ්පාදනය කළ හැකි වේ නම් ය.

**37.** ආනයනික යෙදවුම්වල වටිනාකම රු. 5 000ක් ද අවසාන නිෂ්පාදිතයේ වටිනාකම රු. 10 000ක් ද වන දේශීය කර්මාන්තයක් සැලකිල්ලට ගන්න. අවසාන නිෂ්පාදිතය මත තීරු බද්ද 25%ක් ද ආනයනය කරනු ලබන යෙදවුම් මත තීරු බද්ද 20%ක් ද වේ නම් සඵල ආරක්ෂණ අනුපාතිකය කොපමණ ද?
(1) 5% (2) 15% (3) 25% (4) 30% (5) 32.5%

[හත්වැනි පිටුව බලන්න

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**38.** ශ්‍රී ලංකාව විසින් අත්සන් කරන ලද නවතම ද්විපාර්ශ්වීය නිදහස් වෙළෙඳ ගිවිසුම කුමක් ද?
(1) සිංගප්පූරු - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම
(2) චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම
(3) ඉන්දියා - ශ්‍රී ලංකා විස්තීර්ණ ආර්ථික හවුල්කාරීත්ව ගිවිසුම
(4) බංග්ලාදේශ - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම
(5) තායිලන්ත - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම

**39.** කල්පිත ආර්ථිකයක ගෙවුම් ශේෂ ලේඛනයකට අදාළ දත්ත කිහිපයක් පහත වගුවේ දැක්වේ.

| අයිතමය | වටිනාකම (රු. බිලියන) |
|---|---|
| වෙළෙඳ ශේෂය | 120.1 |
| සේවා ගිණුම් ශේෂය | 29.3 |
| ප්‍රාථමික ආදායම් ශේෂය | –25.8 |
| ද්විතීය ආදායම් ශේෂය | 11.5 |
| ප්‍රාග්ධන ගිණුම් ශේෂය | –35.1 |
| මූල්‍ය ගිණුමේ ශේෂය | –112.6 |
| ශුද්ධ වැරදීම් හා අත්හැරීම් | 12.6 |

ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ ශේෂය කොපමණ ද?
(1) රු. බිලියන 149.4
(2) රු. බිලියන 135.1
(3) රු. බිලියන 100
(4) රු. බිලියන –12.6
(5) රු. බිලියන –135.1

**40.** මාර්ෂල්-ලර්නර් කොන්දේසිය තෘප්ත වන්නේ පහත සඳහන් කවර අවස්ථාවකදී ද?
(1) අපනයන සඳහා ඉල්ලුමේ මිල නම්‍යතාව 0.5ක් ද ආනයන සඳහා ඉල්ලුමේ මිල නම්‍යතාව 0.3ක් ද වන විට
(2) අපනයන සඳහා ඉල්ලුමේ මිල නම්‍යතාව 0.8ක් ද ආනයන සඳහා ඉල්ලුමේ මිල නම්‍යතාව 0.6ක් ද වන විට
(3) අපනයන සඳහා ඉල්ලුමේ මිල නම්‍යතාව 0.2ක් ද ආනයන සඳහා ඉල්ලුමේ මිල නම්‍යතාව 0.4ක් ද වන විට
(4) අපනයන සඳහා ඉල්ලුමේ මිල නම්‍යතාව 0.7ක් ද ආනයන සඳහා ඉල්ලුමේ මිල නම්‍යතාව 0.2ක් ද වන විට
(5) අපනයන සඳහා ඉල්ලුමේ මිල නම්‍යතාව 0.8ක් ද ආනයන සඳහා ඉල්ලුමේ මිල නම්‍යතාව 0.2ක් ද වන විට

**41.** රටක මූර්ත සඵල විනිමය අනුපාතිකය ක්ෂය වන්නේ නම් ඉන් අදහස් කරනුයේ
(1) විදේශ භාණ්ඩවලට සාපේක්ෂ ව එම රටේ අපනයන මිල අඩු වී ඇති බවයි.
(2) රටේ උද්ධමන අනුපාතිකය සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති බවයි.
(3) උද්ධමනය නොවෙනස් ව තිබිය දී එම රටේ නාමික විනිමය අනුපාතිකය ඉහළ ගොස් ඇති බවයි.
(4) වෙනත් ව්‍යවහාර මුදල් ඒකක අඩංගු පැසකට සාපේක්ෂ ව එම රටේ ව්‍යවහාර මුදල් ඒකකයේ අගය වැඩි වී ඇති බවයි.
(5) නාමික විනිමය අනුපාතික නොවෙනස් ව තිබිය දී දේශීය මිල ගණන් ඉහළ ගොස් ඇති බවයි.

**42.** මහ බැංකු ව්‍යවහාර මුදල් හුවමාරු වැඩ පිළිවෙළක් (swap arrangement) යනු කුමක් ද?
(1) භාණ්ඩ හා සේවා හුවමාරු කරගැනීම සඳහා මහ බැංකු අතර ඇති කර ගනු ලබන වැඩ පිළිවෙළකි.
(2) විනිමය අනුපාතික ස්ථාවර කිරීමට හෝ ද්‍රවශීලතාව සැපයීම සඳහා හෝ ව්‍යවහාර මුදල් හුවමාරු කරගැනීම සඳහා මහ බැංකු අතර ඇති කර ගනු ලබන ද්විපාර්ශ්වීය ගිවිසුමකි.
(3) රටවල් අතර පොලී අනුපාතික නියාමනය කිරීමේ යාන්ත්‍රණයකි.
(4) රටක කොටස් වෙළෙඳපොළට සෘජුව ම බලපෑම් කිරීමට ඇති මෙවලමකි.
(5) විදේශ මුදලින් රජයේ බැඳුම්කර අලෙවි කිරීම හා මිල දී ගැනීම සඳහා මහ බැංකු අතර ඇති කර ගනු ලබන ගිවිසුමකි.

**43.** ආර්ථික වෘද්ධිය නිශ්චලන තත්ත්වයක තිබිය දී ත් කිසියම් රටකට තම මානව සංවර්ධන දර්ශකයේ වැඩි දියුණු කිරීමක් ඇති කිරීමට බොහෝ දුරට ඉඩ ඇති සාධකය කුමක් ද?
(1) ආයු අපේක්ෂාව වැඩිවීම
(2) ආදායම් අසමානතාව අඩුවීම
(3) නොවිධිමත් ආර්ථිකයේ වර්ධනය
(4) ළමා මරණ අනුපාතිකය අඩුවීම
(5) පිරිසිදු පානීය ජලය සඳහා ප්‍රවේශය වැඩිවීම

**44.** 'මැදි ආදායම් උගුල' යනුවෙන් අදහස් කරනුයේ
(1) රටකට දරිද්‍රතාවෙන් හා විරැකියාවෙන් මිදිය නොහැකි තත්ත්වයකි.
(2) රටක් මැදි ආදායම් තත්ත්වයට සංක්‍රමණය වීමේ දී උද්ධමන පීඩනයන්ට මුහුණ දෙන තත්ත්වයකි.
(3) මැදි ආදායම් මට්ටම් කරා ළඟා වූ පසුව ඉහළ ආදායම් තත්ත්වයට සංක්‍රමණය වීමට අපොහොසත් වෙමින් වර්ධනය වීමට අරගල කරන තත්ත්වයකි.
(4) පුහුණු ශ්‍රමය නොමැතිකමින් ඉහළ ආදායම් මට්ටම කරා වර්ධනය වීමට පවත්නා බාධාකාරී තත්ත්වයකි.
(5) විදේශ සෘජු ආයෝජන මට්ටම අඩු වීම සහ ඉහළ උද්ධමනය හේතුවෙන් ආර්ථික වර්ධනය සීමාසහිත වීමේ තත්ත්වයකි.

[අටවැනි පිටුව බලන්න

**45.** කාල පරිච්ඡේද දෙකක් සඳහා කිසියම් රටක තෝරා ගත් සමාජ ආර්ථික දත්ත කිහිපයක් පහත වගුවේ දැක්වේ.

| වර්ෂය | නාමික දළ දේශීය නිෂ්පාදිතය (රු. බිලියන) | සාක්ෂරතා මට්ටම (%) | ජනගහනය 1000 කට මරණ සංඛ්‍යාව | සාමාන්‍ය මිල මට්ටම |
|---|---|---|---|---|
| 2010 | 75 | 82 | 78 | 125 |
| 2020 | 120 | 97 | 52 | 150 |

මෙම ආර්ථිකයේ 2010 සිට 2020 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳ ව පහත සඳහන් කුමන ප්‍රකාශය වගුවේ ඉදිරිපත් කර ඇති දත්තවලට අනුකූල වේ ද?

(1) මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ ඉහළ යාමක් සහ ජීවන තත්ත්වයේ වැඩි දියුණුවීමක්
(2) මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ ඉහළ යාමක් සහ ජීවන තත්ත්වයේ පහත වැටීමක්
(3) මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ අඩු වීමක් සහ ජීවන තත්ත්වයේ පහත වැටීමක්
(4) මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ අඩු වීමක් සහ ජීවන තත්ත්වයේ වැඩි දියුණුවීමක්
(5) මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ අඩු වීමක් සහ මානව සංවර්ධනයේ වැඩි දියුණුවීමක්

**46.** වැඩිහිටි යැපුම් අනුපාතය ලෙස විශේෂයෙන් අදහස් කරන්නේ

(1) වැඩකරන වයසේ ජනගහනයට සාපේක්ෂ ව වයස අවුරුදු 65 සහ ඊට වැඩි පුද්ගලයන්ගේ අනුපාතයයි.
(2) මුළු ජනගහනයට සාපේක්ෂ ව වයස අවුරුදු 60 සහ ඊට වැඩි පුද්ගලයන්ගේ අනුපාතයයි.
(3) වයස අවුරුදු 15-59 අතර ජනගහනයට සාපේක්ෂ ව වයස අවුරුදු 60 සහ ඊට වැඩි පුද්ගලයන්ගේ අනුපාතයයි.
(4) වැඩිහිටි ජනගහනයට සාපේක්ෂ ව වයස අවුරුදු 0 - 14 පුද්ගලයන්ගේ අනුපාතයයි.
(5) මුළු ජනගහනයට සාපේක්ෂ ව වයස අවුරුදු 15 - 64 පුද්ගලයන්ගේ අනුපාතයයි.

**47.** ගිනි සංගුණකය ඉහළ අගයක් ගැනීමට බොහෝ දුරට ඉඩ ඇත්තේ පහත දැක්වෙන රටවල් අතුරෙන් කවරකට ද?

(1) සියලු දෙනාට ම නිදහස් සෞඛ්‍යය සහ අධ්‍යාපනය ලබාදෙන රටක්
(2) අඩු විරැකියා අනුපාතිකයක් සහිත ධනාත්මක ආර්ථික වෘද්ධියක් අත්විඳිමින් සිටින රටක්
(3) අනුක්‍රමික බදු පද්ධතියක් සහ ඉතා පුළුල් පුනර්ව්‍යාප්ති ප්‍රතිපත්ති සහිත රටක්
(4) ආදායම් උපයන්නන්ගෙන් පහළ ම 10% මුළු ආදායමෙන් 9%ක් හිමිකරගන්නා රටක්
(5) විශාල නොවිධිමත් අංශයක් සහ අවම සමාජ ආරක්ෂණ ජාල සහිත රටක්

**48.** ශ්‍රී ලංකා ආර්ථිකය සඳහා කොළඹ වරාය නගර ව්‍යාපෘතියේ වැදගත්කම කුමක් ද?

(1) එය විදේශ ආයෝජන සහ වෙළෙඳාම ආකර්ෂණය කරගැනීමේ ප්‍රධාන මූල පිරිමකි.
(2) එය බහාලුම් මෙහෙයුම් කටයුතු සඳහා නාවුක තටාකාංගනයක් සංවර්ධනය කිරීම අරමුණු කරයි.
(3) එය දේශීය නිෂ්පාදනය වැඩි කිරීම කෙරෙහි අවධානය යොමු කරයි.
(4) එය සුවිශේෂ වශයෙන් කොළඹ නගරයේ රැකියා උත්පාදනය කෙරෙහි අවධානය යොමු කරයි.
(5) අනෙකුත් කර්මාන්තවලට වඩා ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රයේ සංවර්ධනයට එය ප්‍රමුඛතාව ලබා දෙයි.

**49.** 2022 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදයට ප්‍රධාන ප්‍රේරකයක් වූයේ

(1) සංක්‍රමණික සේවකයන්ගේ ප්‍රේෂණවල සැලකිය යුතු පහළ වැටීම ය.
(2) ශ්‍රී ලංකා රුපියලේ අගය අධික ලෙස ඉහළ යාම ය.
(3) ගෝලීය තෙල් මිලෙහි වේගවත් ඉහළ යාම ය.
(4) රසායනික පොහොර නිෂ්පාදනයේ අඩුවීම ය.
(5) තිරසාර නොවන අන්දමින් විදේශ ණය සමුච්චනයවීම ය.

**50.** 2023 වර්ෂයේ දී ශ්‍රී ලංකාවට ලබාදුන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ අරමුදල් පහසුකම මූලික වශයෙන් ඉලක්ක කර ඇත්තේ

(1) රටේ උද්ධමන අනුපාතිකය 5%කට වඩා අඩු කිරීම ය.
(2) සාර්ව ආර්ථික ස්ථායිතාව සහ ණය තිරසාරභාවය ප්‍රතිෂ්ඨාපනය කිරීම ය.
(3) 2048 වර්ෂයේ දී ශ්‍රී ලංකාව ඉහළ-ආදායම් රටක තත්ත්වය කරා පරිවර්තනය කිරීම ය.
(4) ස්ථාවර විනිමය අනුපාතික තන්ත්‍රයකට සහාය වීම ය.
(5) රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීම ය.

* * *

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

62473

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

ආර්ථික විද්‍යාව II
பொருளியல் II
Economics II

21 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස් :**

* 'අ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, 'ආ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* ප්‍රස්තාර කඩදාසි සපයනු ලැබේ.

## 'අ' උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

**1.** (i) ආර්ථික සම්පත් සහ නොමිල සම්පත් නිර්වචනය කර, එක් එක් කාණ්ඩයට උදාහරණ **දෙක** බැගින් දක්වන්න. (ලකුණු 04යි)

(ii) 'ශ්‍රමය' සහ 'ව්‍යවසායකත්වය' අතර පවත්නා ප්‍රධාන වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 03යි)

(iii) නිෂ්පාදන හැකියා වක්‍රය සරල රේඛාවක් විය හැක්කේ කුමන කොන්දේසි යටතේ ද? (ලකුණු 03යි)

(iv) විධාන ආර්ථික පද්ධතියක් සහ වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක් තුළ රජයේ කාර්යභාරය සංසන්දනය කරන්න. (ලකුණු 04යි)

(v) හිඟකම පිළිබඳ ගැටලුව වෙළෙඳපොළ, විධාන හා මිශ්‍ර ආර්ථික පද්ධති මගින් විසඳන ආකාරය පැහැදිලි කොට, එකී ප්‍රවේශයන්ගේ සඵලතාව අගයන්න. (ලකුණු 06යි)

**2.** (i) පෞද්ගලික ඉල්ලුම් වක්‍රවලින් වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය ව්‍යුත්පන්න කරගන්නා ආකාරය රූපසටහන් යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) ඉල්ලුමේ මිල නම්‍යතාව යන්නෙන් කවරක් අදහස් වේ ද? මුළු අයභාරයට එය බලපාන්නේ කෙසේ ද? (ලකුණු 03යි)

(iii) භාණ්ඩයක වෙළෙඳපොළ සැපයුම් වක්‍රය කෙරෙහි බලපෑම් කළ හැකි රජයේ ප්‍රතිපත්ති උපකරණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03යි)

(iv) වෙළෙඳපොළ සමතුලිතතාව පිළිබඳ සංකල්පය නිර්වචනය කොට වෙළෙඳපොළ අසමතුලිතතාවක් සමතුලිතතාව කරා රැගෙන යන බලවේග පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(v) (අ) පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදක අතිරික්තය නිර්වචනය කරන්න. (ලකුණු 02යි)

(ආ) ඉල්ලුමේ මිල නම්‍යතාව පාරිභෝගික අතිරික්තයට බලපානු ලබන්නේ කෙසේ දැයි රූපසටහන් යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

[දෙවැනි පිටුව බලන්න

3. (i) විශේෂිත බද්දක් සහ වටිනාකම් බද්දක් (ad-valorem tax) අතර වෙනස පෙන්වා දෙන්න. (ලකුණු 02යි)

(ii) නිදහස් වෙළෙඳපොළක් තුළ සහනාධාරයක් ලබා දීම සහ බද්දක් පැනවීම නිසා ඇතිවන සුබසාධනය අහිමිවීම (deadweight loss) රූපසටහන් යොදා ගනිමින් පෙන්නුම් කරන්න. (ලකුණු 04යි)

(iii) උපරිම මිල සීමාවන් පාරිභෝගික අතිරික්තය, නිෂ්පාදක අතිරික්තය සහ සමස්ත ආර්ථික සුබසාධනය මත ඇති කරන බලපෑම විශ්ලේෂණය කරන්න. (ලකුණු 06යි)

(iv) දියර කිරි සඳහා වෙළෙඳපොළ ඉල්ලුම් ශ්‍රිතය $Q_D = 280 - 2P$ සහ වෙළෙඳපොළ සැපයුම් ශ්‍රිතය $Q_S = -220 + 3P$ වේ යැයි සලකන්න. (ප්‍රමාණ ලීටර මිලියනවලින් සහ මිල රුපියල්වලින් දැක්වේ.)

(අ) සමතුලිත මිල සහ ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 02යි)

(ආ) කිරි ගොවීන් නිෂ්පාදනය කරන සෑම කිරි ලීටරයකට ම රු. 10ක සහනාධාරයක් ලබා දෙන්නේ යැයි සලකන්න. නව සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 04යි)

(ඉ) මෙම තත්ත්වය තුළ මුළු සහනාධාරය ම කිරි ගොවීන්ට හිමි වෙනවා ද? නො එසේ නම් කිරි ගොවීන්ට සත්‍ය වශයෙන් ම හිමිවන්නේ සහනාධාරයෙන් කොපමණ ප්‍රතිශතයක් ද? (ලකුණු 02යි)

4. (i) කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිත සන්දර්භය තුළ හීනවන ආන්තික ඵලදා නීතිය නිර්වචනය කරන්න. (ලකුණු 02යි)

(ii) කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලියේ දී ආයතනයක් ලාභ උපරිම කෙරෙන නිමැවුම් මට්ටම තීරණය කරන්නේ කෙසේ ද? (ලකුණු 03යි)

(iii) නිෂ්පාදන කාල පරිච්ඡේදයක් තුළ, ආයතනයක් රු. 200 000ක මුළු අයභාරයක් උපයාගන්නා අතර, රු. 150 000ක ප්‍රත්‍යක්ෂ වියදම (ඍජු පිරිවැය) ක් දරයි. ආයතන හිමිකරුගේ ප්‍රාග්ධනයේ සහ ශ්‍රමයේ ආවස්ථික පිරිවැය ඇතුළු ව ආරෝපිත පිරිවැය රු. 70 000කි.
ආයතනයේ ගණකාධිකාරී ලාභය සහ ආර්ථික ලාභය ගණනය කරන්න. (ලකුණු 04යි)

(iv) අමුද්‍රව්‍යවල පිරිවැය ඉහළ යාමක් වැනි කරුණක් මත ආයතනයේ පිරිවැය ව්‍යුහයේ ඉහළ යාමක්, ආයතනයේ කෙටි කාලීන සැපයුම් වක්‍රයට සහ සමස්ත කර්මාන්තයේ සැපයුම් වක්‍රයට බලපාන ආකාරය පැහැදිලි කරන්න. ඔබගේ පැහැදිලි කිරීම සඳහා සුදුසු රූපසටහන් යොදා ගන්න. (ලකුණු 05යි)

(v) පූර්ණ තරගකාරී ආයතනයක් තම නිමැවුම ඒකකයක් රු. 120ක් වූ වෙළෙඳපොළ මිලක් යටතේ අලෙවි කරයි. ඒකක 60ක් නිෂ්පාදනය කරන විට ආයතනයේ සාමාන්‍ය විචල්‍ය පිරිවැය රු. 80ක් වන අතර සාමාන්‍ය ස්ථාවර පිරිවැය රු. 20කි.

(අ) මෙම නිමැවුම් මට්ටමේ දී ආයතනයේ මුළු අයභාරය, මුළු පිරිවැය සහ ආර්ථික ලාභය හෝ අලාභය ගණනය කරන්න. (ලකුණු 04යි)

(ආ) එම නිමැවුම් මට්ටමේ දී නිෂ්පාදක අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 02යි)

5. (i) විවෘත ආර්ථිකයක චක්‍රීය ආදායම් ප්‍රවාහ ආකෘතිය තුළ ඇතුළත් කාන්දුවීම් නම් කරන්න. (ලකුණු 03යි)

(ii) ජාතික ගිණුම්කරණ පද්ධතිය තුළ නිෂ්පාදන ඉමෙන් බැහැර කරනු ලබන්නේ කවර ක්‍රියාකාරකම් ද? (ලකුණු 03යි)

(iii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද නැතහොත් අසත්‍ය ද යන්න සඳහන් කොට ඔබේ පිළිතුරට හේතු පැහැදිලි කරන්න.

(අ) යැපුම් ගොවිතැන වැනි තමන්ගේ ම පරිභෝජනය සඳහා භාණ්ඩ නිෂ්පාදනය කරගැනීම නිෂ්පාදන ඉමට ඇතුළත් කෙරේ.

(ආ) ජාතික ගිණුම්කරණ පද්ධතිය තුළ 'අවශේෂ ලෝකය' ආයතනික ඒකකයක් ලෙස සැලකේ.

(ඉ) ව්‍යාපාරික ආයතන විසින් ගෙවනු ලබන වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු, 'නිෂ්පාදනය මත වෙනත් බදුවල' කොටසක් වේ.

(ඊ) මුදල් හුවමාරු කරගැනීමක් සිදු නොවන බැවින් භාණ්ඩ හුවමාරු ගනුදෙනු (barter transactions) නිෂ්පාදන ඉමට ඇතුළත් නො කෙරේ.

(උ) 'නිෂ්පාදිතය මත බදු' අදාළ වන්නේ නිෂ්පාදනය කරන ලද භාණ්ඩ ප්‍රමාණය මත ඍජුව ම පනවනු ලබන බදුවලට පමණි.

(01 × 5 = ලකුණු 05යි)

[තුන්වැනි පිටුව බලන්න

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(iv) ස්වායත්ත පරිභෝජනය රු. බිලියන 200ක් ද ආන්තික පරිභෝජන නැඹියාව වැය කළ හැකි ආදායමෙන් 80%ක් ද ආයෝජනය රු. බිලියන 500ක් ද සහිත සංවෘත ආර්ථිකයක් සැලකිල්ලට ගන්න. තව ද රජයේ වියදම රු. බිලියන 300ක් ද ස්වායත්ත බදු රු. බිලියන 200ක් ද වේ.

මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම් මට්ටම ගණනය කරන්න. (ලකුණු 04යි)

(v) (අ) 'ප්‍රතිගමනාත්මක පරතරය' නිර්වචනය කොට එය සමාහාර ඉල්ලුම්-සැපයුම් ආකෘතියක පෙන්නුම් කරන්න. (ලකුණු 03යි)

(ආ) ප්‍රතිගමනාත්මක පරතරය ඉවත් කොට ආර්ථිකය පූර්ණ සේවා නියුක්ති මට්ටම කරා ගෙන ඒමට ඔබ යෝජනා කරන ප්‍රතිපත්ති නිර්දේශ කවරේ ද? (ලකුණු 02යි)

## 'ආ' උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

**6.** (i) ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්ති සන්දර්භය තුළ බහුල ව භාවිත කෙරෙන මුදල් සමස්ත (money aggregates) **තුන** නම් කරන්න. (ලකුණු 03යි)

(ii) ශ්‍රී ලංකාවේ උද්ධමනය 2022 සැප්තැම්බර් මාසයේ වාර්තා වූ 70%ක පමණ ඉහළ මට්ටම්වල සිට 2023 වර්ෂයේ අවසානයෙන් පසු තනි ඉලක්කමක මට්ටමෙහි තබා ගැනීමට දායක වී ඇති සාධක මොනවා ද? (ලකුණු 04යි)

(iii) මූල්‍ය ප්‍රතිපත්ති සැකසීමේ දී ප්‍රතිපත්ති සම්පාදකයන් මතුපිට උද්ධමනයට වඩා මූලික උද්ධමනය කෙරෙහි අවධානය යොමු කරනුයේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iv) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයේ ඉහළ යාමක් මුදල් සැපයුම සහ බැංකු පද්ධතියේ මුදල් මැවීමේ හැකියාව මත ඇති කරන බලපෑම කුමක් වන්නේ ද? (ලකුණු 04යි)

(v) පොලී අනුපාතික කොරිඩෝව පිළිබඳ සංකල්පය පැහැදිලි කර ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්තිය තුළ එහි කාර්යභාරය විග්‍රහ කරන්න. (ලකුණු 05යි)

**7.** (i) 'පොදු දේපළ සම්පත්' නිර්වචනය කර, ඒවා පොදු භාණ්ඩවලින් වෙන් කොට දක්වන්න. (ලකුණු 04යි)

(ii) ශ්‍රී ලංකාවට බහුපාර්ශ්වීය ණය ලබා දෙන මූලාශ්‍ර **තුනක්** නම් කරන්න. (ලකුණු 03යි)

(iii) වෙළෙඳපොළ අසමත්වීම සහ ආණ්ඩුව අසමත්වීම රටක සම්පත් බෙදා වෙන් කිරීමේ අකාර්යක්ෂමතාවට හේතු විය හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iv) 2022 වර්ෂයේ දී කල්පිත ආර්ථිකයක තෝරාගත් රාජ්‍ය මූල්‍ය දත්ත කිහිපයක් පහත වගුවේ දැක්වේ.

| අයිතමය | වටිනාකම (රු. බිලියන) | අයිතමය | වටිනාකම (රු. බිලියන) |
|---|---|---|---|
| බදු අයභාරය | 1 800 | වර්තන පැවරුම් සහ සහනාධාර | 800 |
| බදු නොවන අයභාරය | 250 | ප්‍රාග්ධන වියදම | 1 000 |
| දීමනා | 50 | ශුද්ධ ණය දීම් | 200 |
| භාණ්ඩ හා සේවා වියදම | 1 200 | ණය ආපසු ගෙවීම් | 1 400 |
| පොලී ගෙවීම් | 1 500 | | |

ඉහත දත්ත යොදා ගනිමින් රජයේ අයවැය ලේඛනයට අදාළ පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) වර්තන ගිණුමේ ශේෂය

(ආ) ප්‍රාථමික ගිණුමේ ශේෂය

(ඉ) සමස්ත ශේෂය

(ඊ) දළ මූල්‍යන අවශ්‍යතා (02 × 4 = ලකුණු 08යි)

**8.** (i) A රටට ශ්‍රම ඒකකයකින් රෙදිපිළි ඒකක 10ක් හෝ පාවහන් කුට්ටම් 5ක් හෝ නිපදවිය හැකි බව ද, B රටට ශ්‍රම ඒකකයකින් රෙදිපිළි ඒකක 15ක් හෝ පාවහන් කුට්ටම් 10ක් හෝ නිපදවිය හැකි බව ද සලකන්න.

(අ) එක් එක් භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ සාපේක්ෂ වාසිය ඇත්තේ කුමන රටකට ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ආ) අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක වෙළෙඳාමක් සිදුවීම සඳහා රෙදිපිළි සහ පාවහන් අතර ඇතිවිය හැකි හුවමාරු අනුපාතික පරාසය තීරණය කරන්න. (ලකුණු 02යි)

(ii) 1977න් පසු ශ්‍රී ලංකාව අඛණ්ඩ වෙළෙඳ හිඟයකට මුහුණ දී සිටීමට බලපා ඇති ප්‍රධාන හේතු මොනවා ද? (ලකුණු 04යි)

(iii) ගෝලීය වෙළෙඳපොළ තුළ ශ්‍රී ලංකාවේ අපනයන තරගකාරීත්වය ඉහළ නැංවීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග කවරේ ද? (ලකුණු 04යි)

(iv) ව්‍යවහාර මුදල් ඒකකයේ බාහිර අගය ක්ෂයවීමක ප්‍රධාන සාර්ව ආර්ථික ප්‍රතිවිපාක මොනවා ද? (ලකුණු 06යි)

**9.** (i) (අ) ඒක පුද්ගල දළ ජාතික ආදායම සංවර්ධන මිනුමක් ලෙස භාවිත කරන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ආ) සංවර්ධනය පිළිබඳ මිනුමක් ලෙස එහි සීමාවන් කවරේ ද? (ලකුණු 03යි)

(ii) මෑත වර්ෂවල දී ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව ඉතා ශීඝ්‍රයෙන් ඉහළ යාමට බලපා ඇති ප්‍රධාන හේතු දක්වන්න. (ලකුණු 04යි)

(iii) ආණ්ඩුකරණයේ දුබලතාව හා දූෂණය ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට බලපාන්නේ කෙසේ ද? (ලකුණු 05යි)

(iv) ශ්‍රී ලංකාවේ ප්‍රජාවිද්‍යාත්මක සංක්‍රාන්තිය ශ්‍රම වෙළෙඳපොළට සහ රාජ්‍ය මූල්‍යයට එල්ල කර ඇති අභියෝග මොනවා ද? (ලකුණු 06යි)

**10.** (i) ශ්‍රී ලංකාව වර්තමානයේ අත්විඳිමින් සිටින ආර්ථික අර්බුදයට බලපා ඇති ප්‍රධාන සාධක කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 04යි)

(ii) වත්මන් ආර්ථික අර්බුදය හමුවේ ශ්‍රී ලංකාවට සහාය වීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය ආයතන ඉටුකරමින් සිටින කාර්යභාරය කුමක් ද? (ලකුණු 04යි)

(iii) ඉදිරි වසර පහක කාලය තුළ ශ්‍රී ලංකාවේ ආර්ථිකය යථා තත්ත්වයට පත්කර ගැනීමට සහ තිරසාර වර්ධනයක් කරා යොමු කිරීමට ආමන්ත්‍රණය කළ යුතු ප්‍රධාන අභියෝග මොනවා ද? (ලකුණු 06යි)

(iv) ඩිජිටල් යටිතල පහසුකම් දියුණු කිරීම මගින් ශ්‍රී ලංකාවේ ආර්ථික වෘද්ධිය, ආර්ථික කාර්යක්ෂමතාව හා ගෝලීය තරගකාරීත්වය ඉහළ නැංවිය හැක්කේ කෙසේ ද? (ලකුණු 06යි)

***

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න